සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකය: |
|---|

සැ.යු. :-
- **නිවැරදි පිළිතුර සලකුණු කරන්න.**

01. (ස)(රි)(ග) ම (ප)(ධ) නි (ස්) යන ශුද්ධ ස්වරයන්ගෙන් සලකුණු කර ඇති ස්වර පමණක් යෙදෙන රාගය වන්නේ,

(1) බිලාවල් රාගය (2) යමන් රාගය (3) භූපාලි රාගය (4) කාෆි රාගය

02. සරල සංගීතයේදී ඉදිරිපත් කරනු ලබන ගීතයක් අනුවාදනය සඳහා යොදාගත හැකි අවනද්ධ සංගීත භාණ්ඩය,

(1) සිතාරයයි. (2) තබ්ලාවයි. (3) වයලීනයයි. (4) මැන්ඩලීනයයි.

03. ජන ගී වර්ගීකරණයට අනුව මෙහෙ ගීයක් වන්නේ,

(1) ලී කෙළි ගී (2) ප්‍රශස්ති ගී (3) යාග ගී (4) නෙළුම් ගී

04. සරිස ගරිස යන ස්වර අභ්‍යාසය උච්ච සඩ්ජය දක්වා ලිවීමේදී එහි අවසාන පියවර වන්නේ,

(1) ගමධ පනිස් (2) මගම ධනිස් (3) පධනි ධනිස් (4) ධනිධ ස්නිධ

05. ග්‍රැමෆෝන් යුගයේ මුල් වකවානුවේ ගායකයෙකි,

(1) පණ්ඩිත් අමරදේව (2) එච්.ඩබ්ලිව්. රූපසිංහ (3) සුනිල් ශාන්ත (4) ධර්මදාස වල්පොල

06. මේලයකින් සිදුවන ප්‍රධාන කාර්යය වන්නේ,

(1) ථාට බිහි කිරීමයි. (2) රාග බිහි කිරීමයි. (3) නාද බිහි කිරීමයි. (4) සප්තක බිහි කිරීමයි.

- **අංක 07 සිට 10 තෙක් ප්‍රශ්නවලට පහත සඳහන් පුද්ගලයින් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

A - රවීන්ද්‍රනාත් තාගෝර්
B - පණ්ඩිත් රවිශංකර්
C - එදිරිවීර සරච්චන්ද්‍ර
D - නීතීඥ ජෝන්ද සිල්වා

07. වංග සංගීතය ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූ සංගීතඥයා දැක්වෙන නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය වන්නේ

(1) A (2) B (3) C (4) D

08. නූර්ති හා නව නාට්‍ය සම්ප්‍රදායන් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීමට විශේෂ දායකත්වයක් සපයනු ලැබූ දෙදෙනා දක්වනු ලබන්නේ,

(1) A හා B (2) D හා C (3) C හා A (4) A හා C

09. ඉන්දියානු ජාතික ගීයේ නිර්මාතෘ ඇතුළත් වන්නේ,

(1) B (2) A (3) C (4) D

10. හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩය වාදනය සඳහා ප්‍රකට ශිල්පියා වන්නේ,

(1) B (2) A (3) C (4) D

11. නාදයේ ගුණ කීයක් ලෙස නම් කර තිබේද?

(1) 4 කි. (2) 3 කි. (3) 2 කි. (4) 6 කි.

12. කපිරිඤ්ඤා සංගීතයේ ආභාසය ලද ගීතයකි,

(1) වඳිමු සුගත (2) මී වදයකි ජීවිතේ

(3) ඇසේ මතුවන (4) ඕලු පිපීලා විල ලෙලදෙනවා

13. ගාන්ධාරය හා නිශාදය පමණක් විකෘති ස්වර වශයෙන් යෙදෙන රාගය වන්නේ,

(1) භූපාලි (2) යමන් (3) කාෆි (4) භෛරවී

14. යමන් රාගය ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීතයක් වන්නේ,

(1) සාධු දන්ත ද (2) කළිඳු ගංගා දෙණියේ

(3) කවාලා විළද ජාතී (4) ගුමු ගුමුව වදුලේ

15. ශ්‍රී ලංකාවේ ගැමි සංගීතයේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) ස්වර මූලික වීම.

(2) ගායනය සඳහා සංගීත භාණ්ඩ යොදා ගැනීම.

(3) මුඛ පරම්පරාවෙන් පැවත ඒම.

(4) නාද මාලාව සංකීර්ණ වීම.

16. තබ්ලාවෙන් වැයෙන තාල පදය හැඳින්වීම සඳහා මෙය යොදා ගැනේ.

(1) බලිය (2) සමග්‍රහය (3) ඨේකාව (4) ආවර්තය

17. 'හෙළ ගී මග නැමැති ග්‍රන්ථයෙහි කතුවරයා වන්නේ,

(1) ඩබ්ලිව්.බී. මකුලොලුව (2) එම්.ජී. පෙරේරා

(3) වින්සන්ට් සෝමපාල (4) සුනිල් ශාන්ත

18. 'රැගත් සුරා පිරුවිතින්' යන දොළොස්මත් පැදිය,

(1) හටන් කවියකි. (2) සේ ගීයකි.

(3) ප්‍රශස්ති ගීතයකි. (4) වන්නමකි.

19. වාදී ස්වරය යනු රාගයක,
(1) ප්‍රධාන ස්වරයයි. (2) උප ප්‍රධාන ස්වරයයි.
(3) නොයෙදෙන ස්වරයයි. (4) විකෘති ස්වරයයි.

20. වර්තමානයේ වැඩි වශයෙන් භාවිතා වන විද්‍යුත් තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) ඔක්ට පෑඩය (2) සින්තසයිසරය (3) මැන්ඩලීනය (4) පියානෝව

21. පහත රට සම්ප්‍රදායට අයත් ගැමි නාට්‍යයකි,
(1) සොකරි (2) ප්‍රශස්ති (3) නූර්ති (4) කෝළම්

22. නාදය උස් හඬින් හා පහත් හඬින් ගායනය හෝ වාදනය කිරීම,
(1) විපුලතාවයයි. (2) ධ්වනි ගුණයයි. (3) තාර තාවයයි. (4) රූප භේදයයි.

23. අනාඝාතාත්මකව ගැයිය යුතු ගීත යුගලය වන්නේ,
(1) ගොයම් ගී - නෙළුම් ගී
(2) තුන්සරණේ ගී - ශාන්ති කර්ම ගී
(3) ගැල් ගී - පැල් ගී
(4) කෙළි ගී - ගොයම් ගී

24. සේ ගී වර්ගයට අයත් ගීත දෙකක් වන්නේ,
(1) මෙහෙ ගී හා බැති ගී (2) සමාජ ගී හා ප්‍රශස්ති
(3) හටන් ගී හා ඇදහිලි ගී (4) වන්නම් හා ප්‍රශස්ති

25. ''බුද්ධ | ංසර | ණේss | sss | සිරස | දරාs | ගෙනs | sss'' මෙම ගී පාදයේ,
(1) සදෘස්මත් 16 වන අතර ගීමත් 24 කි.
(2) ගීමත් 16 වන අතර සදෘස්මත් 16 කි.
(3) සදෘස්මත් 12 වන අතර ගීමත් 24 කි.
(4) ගීමත් 24 වන අතර සදෘස්මත් 20 කි.

26. දරු නැළවිලි ගී අයත් වන්නේ,
(1) මෙහෙ ගී (2) බැති ගී (3) සමාජ ගී (4) ඇදහිලි ගී

27. ෂ්‍යාහි නම් වූ කොටස අයත් සංගීත භාණ්ඩය වන්නේ,
(1) සිතාරය (2) වයලීනය (3) තබ්ලාව (4) එස්රාජය

28. උඩරට සම්ප්‍රදායට අයත් විතත ගණයේ භාණ්ඩයකි,
(1) දවුල (2) උඩැක්කිය (3) රබාන (4) තම්මැට්ටම

29. ''රූ රැසේ අදිනා ලෙසේ'' යන සේ ගීය ගායනා කළයුතු දේශීය තිත වන්නේ,
(1) සුළු මැදුම් දෙතිතටයි. (2) මැදුම් තනි තිතටයි.
(3) සුළු මහ දෙතිතටයි. (4) මැදුම් මහ දෙතිතටයි.

30. ස්වර ලිපි බලා වාදනය කිරීමේදී 3/4 යන ආකාරයට දක්වා ඇත්නම් එය සමාන වනුයේ,

(1) ත්‍රිතාලයට ය. (2) දාදරා තාලයට ය. (3) ජප් තාලයට (4) කෙහෙර්වා තාලයට ය.

31. භක්තිය පිළිබඳ හැඟීම් උපදවන ගී විශේෂයක් වනුයේ,

(1) තාරාණා ගීතය. (2) සර්ගම් ගීතය. (3) ලක්ෂණ ගීතය. (4) භජන් ගීතය.

32. ශාස්ත්‍රීය සංගීතයට අනුව ලයෙහි ප්‍රභේද වන්නේ,

(1) 2 කි. (2) 1 කි. (3) 3 කි. (4) 4 කි.

33. ස්වර ලිපියක Introduction වශයෙන් හඳුන්වන්නේ,

(1) ගීතයේ ස්ථායි කොටසයි. (2) අතුරු වාදන කොටසයි.

(3) හඳුන්වාදීමේ වාදන කොටසයි. (4) ගීතයේ අන්තරා කොටසයි.

34. F major හා G major යන ස්කේල වල යෙදී ඇති විකෘති ස්වර පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?

(1) ග ම (2) නි ම (3) ධ නි (4) රි නි

35. පහත සඳහන් ස්වර ඛණ්ඩයන්ගෙන් යමන් රාගයට අයත් අනුවාදී ස්වර වන්නේ,

(1) ස රි ප ධ නි (2) ස ග ම´ ධ නි (3) ස රි ම´ ප ධ (4) ස ග ප ධ නි

36. බෙම්ටො තාලයට සමාන බටහිර සංගීත තාල සංකේතය වන්නේ,

(1) 2/2 (2) 2/4 (3) 2/8 (4) 6/8

37. අලුවකින් (Bow) වැයෙන භාණ්ඩ යුගලය වන්නේ,

(1) සිතාරය - එස්රාජයයි. (2) සිතාරය - මැන්ඩලීනයයි.

(3) වයලීනය - එස්රාජයයි. (4) වයලීනය - බටනලාවයි.

38. හින්දුස්ථානි සංගීතයේ තාලයක ප්‍රබල ස්ථානය

(1) සමග්‍රහයයි. (2) බලියයි. (3) අනුතාලයයි. (4) විරාමයයි.

39. යමන් රාගයේ ගායන සමය වන්නේ,

(1) රාත්‍රි දෙවන සමයයි. (2) දිවා ප්‍රථම සමයයි.

(3) රාත්‍රි ප්‍රථම සමයයි. (4) දිවා දෙවන සමයයි.

40. බටහිර ක්‍රමයට අනුව වයලීනයේ තත් හඳුන්වා ඇති නිවැරදි පිළිතුර වන්නේ,

(1) E, A, D, G (2) C, G, C, G (3) G, A, D, E (4) G, C, G, C

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**උපදෙස් :**

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

---

(01) i. නූර්ති සඳහා යොදාගත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,

ii. ''තත් සියයක් ඇති'' යන අරුත ඇති තන්ත්‍රිය භාණ්ඩය .................................................... යි.

iii. හොරණෑව සහ ෂෙණායි යන භාණ්ඩ යුගල .................................................... වාද්‍ය ගණයට අයත් වේ.

iv. | සත් | වෙත්ම | හත් | අදර | මෙම කවියේ තිත වන්නේ .................................................... යි.

v. | නිරි ගරි සස නිරි | ගම් පම් ගරි සස | මෙම තානය අයත් මේලය වන්නේ, ....................................

vi. ඊශ්වරී රාජ් නම් වාදිකාව හා බැඳුන වාද්‍ය භාණ්ඩය .................................................... යි.

vii. ''ආලෙ බැන්ද මාගෙ රම්‍යවන්'' මෙම ගීතය ඇතුළත් නාට්‍ය වන්නේ. ....................................

viii. $F^{\#}$ මෙම බටහිර ස්වරය පෙරදිග ක්‍රමයට හඳුන්වන්නේ .................................................... ලෙසයි.

ix. අමීර් කුෂ්රු විසින් නිර්මාණය කරන ලද තන්ත්‍රිය භාණ්ඩය වන්නේ ....................................

x. ''දුර පෙනෙන තැනිතලා'' - ''දෑඩි කළ මාතා'' මෙම ගීත .................................... යුගයට අයත් ගීත වේ.

xi. වයලීන පවුලේ විශාලතම භාණ්ඩය වන්නේ ....................................................

xii. නූර්ති ගීතවල තාලයෙන් තොරව ගයන කොටස .................................................... නමින් හැඳින්වේ.

(ලකුණු 12)

(02) පහත A, B වශයෙන් වෙන්කර ඇත්තේ නිර්දේශිත රාග දෙකකට අයත් ස්වර සංගති දෙකකි.

A නි රි ග රි ස , නි ධ නි රි ස

B ස රි ග ම , ග රි ස

(1) A හා B රාග නම් කරන්න. (ල. 01)

(2) රාග දෙකේ විශේෂ ලක්ෂණ තුන බැගින් ලියන්න. (ල. 03)

(3) A හා B රාගවලින් එකක මධ්‍ය ලය ගී, සර්ගම් යන ගී වලින් එකක ස්ථායි හා අන්තරා ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(ලකුණු 12)

(03) i. පහත සඳහන් තබ්ලා අක්ෂර උපයෝගී කර ගනිමින් හින්දුස්ථානි තාල දෙකක් ගොඩනගා අදාල පරිදි ප්‍රස්තාර කර නම් කරන්න. (අක්ෂරයක් එක්වරකට වඩා යොදාගත හැකිය) (ල.06)

ධා , නා , ධිං , තු , තා , තිං , ධි

ii. එම තාල දෙකට සමාන දේශීය තිත් රූප නම් කරන්න. (ල.03)

iii. ඉන් එක් තිත් රූපයකට අදාළ බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.03)

(04) ජන ගී වර්ගීකරණය අනුව පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.


i. මූලික ජන ගී ප්‍රභේද දෙක නම් කරන්න. (ල.02)

ii. ගැමි ගී බිහිවීමට හේතු සාධක වූ ප්‍රධාන කරුණු තුන නම් කරන්න. (ල.03)

iii. එම කරුණු මත බිහි වූ ගැමි ගී සඳහා එක් උදාහරණය බැගින් නම් කරන්න. (ල.03)

iv. ඔබ උගත් ආසාතාත්මක ගැමි ගීතයක ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න. (ල.04)

(05) පහත දැක්වෙන රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.




i. ABCDE යන කොටස් නම් කරන්න. (ල.06)

ii. ඉහත කොටස් දෙකෙන් දහිනා කොටස හා බායාව කොටස (අ) සහ (ආ) ලෙස වෙන්කර දක්වන්න. (ල.03)

iii. තබ්ලාවෙහි මුහුණත් දෙකක් ඇඳ එහි ධා, නා, ධිං යන අක්ෂර පිහිටන තැන් සලකුණු කර ලියා දක්වන්න. (ල.03)

(06) පහත දී ඇත්තේ නාඩගම්, නූර්ති, නව නාට්‍ය, කෝලම් යන නාට්‍ය සම්ප්‍රදායන්වලට අයත් ගීත කිහිපයකි.

A - මුහුදු පතුට යට ඉදලා

B - අද වෙස්සන්තර රාජ පුතා

C - උත්තමවන් ලොව පතලා

D - ගම්භිර කාලිංග නුවර

i. ඉහත A, B, C, D කොටස්වල දැක්වෙන ගී පද අයත් රංග සම්ප්‍රදායන් වෙන්කර ලියන්න. (ල.04)


ii. B හා C ගීත අයත් වන රංග සම්ප්‍රදායන් දෙකකට අදාල වන සංගීතමය ලක්‍ෂණ දෙක බැගින් වෙන් වෙන්ව ලියන්න. (ල.04)

iii. ඉහත එක් සම්ප්‍රදායකට අයත් ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)


(07) පහත සඳහන් මාතෘකා 03 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ල.4×3=12)

1. සදෘස්මත් - ගීමත්
2. ආවර්ත - තාල සංඥා
3. වාදි - සංවාදි
4. හාර්මනි - මෙලඩි
5. වන්නම් - ප්‍රශස්ති
6. ලක්‍ෂණ ගීත - ස්වර ස්ථාපන ගීත
7. අනාඝාතාත්මක ගී - ආඝාතාත්මක ගී

(08) (අ)



(ආ)



i. ඉහත දී ඇති බටහිර ස්වර ප්‍රස්තාර කර ඇති ගී පාද දෙක පෙරදිග ක්‍රමයට හරවා නැවත ලියන්න. (ල.08)

ii. ඉහත බටහිර ප්‍රස්තාර දෙකේ යෙදී ඇති ස්වර සංකේත දෙක නම් කරන්න. (ල.02)

iii. ඉහත ප්‍රස්තාරය දෙකේ මාත්‍රා බෙදීමට ගැලපෙන TIME SIGNATURE (ටයිම් සිග්නේචර්) රේඛා මණ්ඩලයක ඇඳ ලකුණු කරන්න. (ල.02)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2018**

**10 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(4) | 5 -(2) | 6 -(2) | 7 -(1) | 8 -(2) | 9 -(2) | 10 -(1) |
| 11-(2) | 12 -(2) | 13 -(3) | 14 -(1) | 15 -(3) | 16 -(3) | 17 -(1) | 18 -(2) | 19 -(1) | 20 -(1) |
| 21-(4) | 22 -(3) | 23 -(3) | 24 -(4) | 25 -(1) | 26 -(3) | 27 -(3) | 28 -(4) | 29 -(4) | 30 -(2) |
| 31-(4) | 32 -(3) | 33 -(3) | 34 -(2) | 35 -(3) | 36 -(4) | 37 -(3) | 38 -(1) | 39 -(3) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)


## II පත්‍රය

(01) i. තබ්ලාව ii. සන්තූර් iii. සුෂිර iv. සුළු මැදුම් දෙතිත
v. කල්‍යාණ vi. එස්රාජය vii. කාලගෝල viii. තීව්‍ර ම
ix. සිතාරය x. ග්‍රැමෆෝන් xi. ඩබල් බේස්ය xii. දොහොරාව (ල.12)

(02) i. A - යමන්
B - භෛරවි (½ x 2 = 01)
ii. A හා B රාගවල විශේෂ ලක්ෂණ 3 බැගින් ලියා ඇතිවිට (½ x 62 = 03)
iii. A හා B රාගවලින් එකක ස්ථායි කොටසට අයත් ස්වර ලියා ඇති විට (ල. 04)
අන්තරා කොටස ලියා ඇතිවිට (ල. 04)

(03) i. නිර්මාණය කරන ලද තාල දෙකට - ලකුණ 02 × 03 = 06 / තාල නම්කර නොමැති විට - ලකුණු 04
ii. තිත් රූප දෙක නම් කිරීමට ලකුණු 01½
iii. බෙර පද ප්‍රස්තාර කිරීමට ලකුණු 03

(04) i. ගැමි ගී, සේ ගී - ලකුණු 02
ii. වෘත්තීන් මත, ඇදහිලි හා විශ්වාස මත, සමාජ අවශ්‍යතා හා විනෝදාස්වාදය
iii. උදාහරණයකට ලකුණු 1 බැගින්
iv. ගීත ස්වර ප්‍රස්තාරයට - ලකුණු 04





(05) i. A - ශ්‍යාහි B - ගට්ඨා C - ගජරා D - චාන්ටි E - ලව (ල.06)
ii. (අ) බායං (ආ) දහිනා (ල.03)
iii. නිවැරදි ස්ථාන නම්කර ඇත්නම් ලකුණු පිරිනමන්න. (ල.03)

(06) i. A - නවනාට්‍යය B - නූර්ති C - නාඩගම් D - කෝළම් (ල.04)
ii. (B) සංගීතමය ලක්ෂණ දෙකකට - ● උත්තර භාරතීය සංගීතය ඇසුරු කරයි. ● තබ්ලාව ප්‍රධාන වාද්‍ය (අවනද්ධ) භාණ්ඩය වේ. ● දොහොරාව භාවිතා වේ. (ල.02)
(C) සංගීතමය ලක්ෂණ දෙකකට - ● දකුණු ඉන්දීය සංගීතය ඇසුරු කරයි. ● මද්දල ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වේ. ● උරුට්ටුව භාවිතා වේ. (ල.02)
iii. ගීත ස්වර ප්‍රස්තාරයට (ල.04)

(07) තෝරාගත් මාතෘකා තුනක කෙටි පිළිතුරු නිවැරදිව ලියා ඇතිවිට අදාල ලකුණු පිරිනමන්න. (ල.4×3=12)

(08) i. (අ) |සපප |පපම |පස්නි |රිස්- | (ල.04) (ආ) |ධපධ |ස-රි |ග-ධ |ප-ප | (ල.04) (ල.08)

ii.  - Crotchet  - Minim (ල.02)

iii.  (ල.02)